**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **පළමු වාර පරීක්ෂණය** | **2018** | **11 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை** | **2018** | **தரம் 11** |
| **First Term Test** | **2018** | **Grade 11** |

| | |
|---|---|
| *නාට්‍ය හා රංග කලාව - II* | *පැය දෙකයි* |
| ***Drama and Theatre - II*** | ***Two Hour*** |

**නම/විභාග අංකය :- ..........................................................................................................**

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ක් ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

01. ඔබට නිර්දිෂ්යව ඇති දික්තල කාලගෝල නාට්‍ය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. මෙම නාට්‍යයේ මුල් රචකයා හා වර්තමාන නිෂ්පාදකයා නම් කරන්න. (ල.02)

II. මෙම නාට්‍ය නිර්මාණය කිරීමට පාදක කරගත් සම්ප්‍රදාය හා රංග ශෛලිය නම් කරන්න. (ල.02)

III. ඉහත නාට්‍යයේහි ප්‍රධාන ගැටුම කුමක්ද? (ල.02)

IV. නාට්‍යයේ සඳහන් පහත වචන සඳහා අරුත් සපයන්න. (ල.02)

අමිත්තිරියක් -
අම්බරයේ -
කඹුට -
සකියෝ -

V. මෙම නාට්‍යයේ දික්තලා විසින් ගයන ගීත කොටසක් ලියා දක්වන්න. (ල.02)

VI. මෙම නාට්‍ය තුළින් නාට්‍ය කරුවා ලබාදෙන පණිවිඩය කුමක්ද? (ල.02)

02.

I. ප්‍රාසාංගික කලාවක් යනු කුමක්ද? (ල.02)

II. ප්‍රාසාංගික කලා 04 ක් ලියන්න. (නාට්‍ය කලාව හැර වෙනත්) (ල.04)

III. ප්‍රාසාංගික කලා අතරින් නාට්‍ය කලාව වෙනස් වන ආකාරය කරුණු 03 ක් ඇසුරින් විස්තර කරන්න. (ල.06)

03.

I. රංගාලෝකයේදී භාවිතා කරණු ලබන ප්‍රධාන පහන් වර්ග 02 ක් ලියන්න. (ල.02)

II. වේදිකා රූපය අර්ථවත් කිරීමට යොදාගත හැකි ආලෝක උපක්‍රම පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ල.04)

III. නාට්‍යකදී ඉහත පහන් වර්ග දෙක උපයෝගීකර ගන්නා ආකාරය විස්තර කරන්න. (ල.06)

04.

I. පහත රට ප්‍රදේශයේ ප්‍රචලිත කාන්තාවන් විෂයෙහි පවත්නා ශාන්තිකර්මයේහි නම ලියන්න. (ල.02)

II. එම ශාන්තිකර්මයන්හි එන නාට්‍යමය අවස්ථාවන් දෙකක් නම් කරන්න. (ල.04)

III. ඉහත නාට්‍යමය අවස්ථාවක අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ පිළිබඳ විස්තර කරන්න. (ල.06)

05.

I. සමාරෝපය යන්න පැහැදිලි කරන්න. (ල.02)

II. එහි ප්‍රභේද කීයද? ඒ මොනවාද? (ල.04)

III. චරිතයකට සමාරෝපය වීමට නළුවකු අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවාද? (ල.06)

06.

I. සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු 02 ක් ලියන්න. (ල.02)

II. සොකරි ජන නාටකයේ කථා පුවත කෙටියෙන් ලියා දක්වන්න. (ල.04)

III. එහි රංග ශෛලිය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ල.06)

07.

I. පහත දැක්වෙන කථා සැකිල්ල ඔබ කැමති අවසානයක් කරා ගෙන යමින් නාට්‍ය පෙළක් රචනා කරන්න.

සුපුන් දමිත් හා නාලක එකම පන්තියේ ඉගෙන ගන්නා මිතුරන් තිදෙනෙකි.දිනක් ඔවුන් පාසල අවසාන වී නිවසට පැමිණෙමින් සිටින අතරතුරදී කැලෑදෙසින් විශාල කෙඳිරිලි හඬක් ඇසී ක්‍රමයෙන් අඩුවෙමින් යයි...එයට කන් දෙන ඔවුන් හඬ නැගුණු දෙසට හෙමින් හෙමින් කිට්ටු වන විට එක් වරම ඔවුන් දෙසට ...........

- නාට්‍යෝචිත අවස්ථා ගොඩනැගීම (ල.04)
- සංවාද,රංග විධාන සහිතව පිටපත ගොඩනැගීම (ල.06)